19th March. 2009 (Thursday)

# ඇදුම සුවකළ ජපන් බයෝපති

මගේ පුතා වයස දහය වනතෙක්ම ඇදුම රෝගයෙන් අනේක විධ වද වේදනා විඳි අයෙකි. රෝගය හැදුනේ මාස 9 යක තරම් ළදරු වයසේදීය. මුලදී කොළඹ ළමා රෝහලෙන් ප්‍රතිකාර ගත් අතර දිනකට බෙහෙත් වර්ග කිහිපයක් ලබාදීමට සිදුවිය. රෝගය උග්‍ර වූ විට නෙබියුලයිස් කරන වාර ගණන ද සෑහෙන ප්‍රමාණයකි. පසුව පුද්ගලික ප්‍රතිකාර ලැබූ අතර ඉන්හේලරය පවා දිනකට තුන් වරක් දිය යුතුය. මෙහි තත්ත්වය කෙටියෙන් කිවහොත් සඳහන් කළ යුත්තේ පුතා වෛද්‍යවරුන්ගේ දක්ෂතාවය නිසාම ජීවතුන් අතර සිටින බවයි. දූවිලි, සීතල පරිසරය කෑම බීම වැනි දේවල් වලින් පරිස්සම් වීම අත්‍යාවශ්‍ය විය. කෙටියෙන් කිවහොත් වසර දහයක් තිස්සේ මුළු පවුලේ උදවියම ළමයාගේ රෝග තත්ත්වය නිසා අනේක විධ දුක් කම්කටොලුවලට භාජනය විය.

මීට ටික කලකට පෙර මාස හතරක් තරම් ළදරුවියේදී මෙම රෝගයට භාජනය වී වසර හතරේදී බයෝපති ප්‍රතිකාර ලබා සම්පූර්ණ සුවය ලැබුවකු පිළිබඳව ඔහුගේ පියා විසින් පළකල පුවතක් පුවත්පතක සඳහන් විය. එහි සඳහන් වූ බයෝපති මධ්‍යස්ථානයේ 0777 320 898 දුරකථනයෙන් තොරතුරු විමසා බයෝපති ප්‍රතිකාරවලට යොමු වූයෙමි. විකල්ප වෛද්‍ය ක්‍රමයක් වන බයෝපති ප්‍රතිකාර ආරම්භ කර මාස දෙකක් ගතවන විට එතෙක් භාවිතා කළ ඉන්හේලරය නිතර පාවිච්චි කිරීමට අවශ්‍ය නොවන මට්ටමට රෝගියා සුවය ලැබීය. මාස හතරක් පහක් ගතවන විට හදිසි අවස්ථාවකදී එය පාවිච්චි කළ යුතු මට්ටමක් දක්වා සුවය ලැබීය. මේ අවස්ථාව වන විට කෑම ගැනීමේ ප්‍රමාණය සාමාන්‍ය එම වයසේ ළමයෙකුගේ මට්ටමට වර්ධනය විය. මාස හයක ප්‍රතිකාර අවසානයේ වෙනද අසාත්මික වන ආහාරපාන සියල්ලම එක දිගට ලබාදෙන ලෙස වෛද්‍යවරයා උපදෙස් දුන්නේය. ආහාර පාන කිසිවකට අසාත්මික නොවන මට්ටමක් පෙන්වූ නිසා පාරිසරික සහ කාලගුණික වෙනස්වීම් වලට පෙන්වන අසාත්මිකතාවයද සොයා බැලීමට උපදෙස් දී ඒවාටද ඔරොත්තු දීමේ හැකියාව තිබූ නිසා ප්‍රතිකාර අනවශ්‍ය බව වෛද්‍ය මතය විය.

අද මා මේ පිළිබඳව හෙළි කරන අවස්ථාව වනවිට මගේ පුතා සම්පූර්ණ සුවය ලබා වසරක් ඉක්ම ගොස් ඇත. ඉතා කුඩා අවධියේ පටන් වසර 10 තිස්සේ බටහිර වෛද්‍යවරුන්ගේ ප්‍රතිකාර මගින් රෝගී තත්ත්වය පාලනය කිරීම පිළිබඳව ඔවුන් ගත් වෙහෙස මම ඉතාමත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි. බයෝපති ප්‍රතිකාර මෙම රෝගය සම්බන්ධයෙන් ඉතාමත් ඉහල කාර්යක්ෂමතාවයකින් යුතු බව සමාජයට අවබෝධ කරදීම මා වැනි දෙමාපියන් රාශියකට වැදගත් පණිවිඩයකි. මගේ පුතා රැගෙන වසර දහයක් තිස්සේ බොහෝ ප්‍රතිකාර කරන ආයතනවලට ගිය අවස්ථාවල මෙම රෝගය නිසා දුක්විඳින ළමා පරපුර ගැන මම බොහෝ තොරතුරු දනිමි. අප දෙමාපියන් ලෙස නිවැරදි ප්‍රතිකාරය දෙසට අනෙක් දරුවන් යොමු කිරීමෙන් කරන්නේ බෞද්ධයෙකු වශයෙන් පුණ්‍ය කර්මයකි. එමෙන්ම මෙය අපේ ළමා පරපුර මෙම රෝගී තත්වයෙන් මුදවා ලීමෙන් සෞඛ්‍ය සම්පන්න සමාජයක් ඇති කිරීමට උරදීම වශයෙන් රටට ද හෘද සාක්ෂියට එකහව කරන උදාර මෙහෙවරකි.

තවද මාස හයකටත් වැඩි කාලයක් තිස්සේ බයෝපති ප්‍රතිකාර ලබමින් සිටි බොහෝ දෙනෙක් මට හමුවිය. ඉන් බොහෝ දෙනෙක් හෘද රෝග, ඇදුම, ඉරුවාරදය, ගැස්ට්‍රයිටිස්, අධික රුධිර පීඩනය වැනි දනට සාර්ථක ප්‍රතිකර්ම නොමැති රෝගී තත්වයන්ට මුහුණ දුන් අයවිය. ඔවුන් ප්‍රතිකාර පිළිබඳව ප්‍රශංසා කොට කතා කරන බව නිරතුරුව අත්දැකීමෙන් ලද්දකි. මගේ අත්දැකීමේ හැටියට බොහෝමයක් රෝගී තත්වයන්ට බයෝපති ප්‍රතිකාර ඉදිරියෙන්ම සිටින බව පැවසීම අතිශෝක්තියක් නොවේ. මගේ එම ප්‍රකාශය යම්කිසි දිනක සමාජය ප්‍රත්‍යක්ෂ වශයෙන්ම තේරුම් ගන්නා බව සක් සුදක්සේ පැහැදිලිය. මේ පිළිබඳව උනන්දුවන අයෙකුට තොරතුරු ලබා දීමට මාගේ දුරකථනය විවෘතව පවතී.

**077 695 6177**
**ආර්.ඒ. මංගලිකා**
**සිංහාර මුල්ල, කැලණිය**




# ඇදුම සම්පූර්ණයෙන් සුවකළ හැකි රෝගයකි

මගේ පුතා වයස දහය වනතෙක් ම ඇදුම රෝගයෙන් අනේක විධ වද වේදනා විඳි අයෙකි. රෝගය හැදුනේ මාස 9 ක තරම් ළදරු වයසේදීය. මුලදී කොළඹ ළමා රෝහලෙන් ප්‍රතිකාර ගත් අතර දිනකට බෙහෙත් වර්ග කිහිපයක් ලබාදීමට සිදු විය. රෝගය උග්‍ර වූ විට නෙබියුලයිස් කරන වාර ගණන ද සැහෙන ප්‍රමාණයකි. පසුව පුද්ගලික ප්‍රතිකාර ලැබූ අතර ඉන්හේලරය පවා දිනකට තුන්වරක් දිය යුතුය. මෙහි තත්ත්වය කෙටියෙන් කිවහොත් සඳහන් කළ යුත්තේ පුතා වෛද්‍යවරුන්ගේ දක්ෂතාවය නිසාම ජීවතුන් අතර සිටින බවයි. දූවිලි, සීතල පරිසරය, කෑම බීම වැනි දේවල්වලින් පරිස්සම් වීම අත්‍යාවශ්‍ය විය. කෙටියෙන් කිවහොත් වසර දහයක් තිස්සේ මුළු පවුලේ උදවියම ළමයාගේ රෝග තත්ත්වය නිසා අනේක විධ දුක් කම්කටොලුවලට භාජන විය.

මීට ටික කලකට පෙර මාස හතරක් තරම් ළදරුවියේදී මෙම රෝගයට භාජන වී වසර හතරේදී බයෝපති ප්‍රතිකාර ලබා සම්පූර්ණ සුවය ලැබුවකු පිළිබඳව ඔහුගේ පියා විසින් පළ කළ පුවතක් දිවයින ඉරිද සංග්‍රහයේ තිබුණි. එහි සඳහන් වූ බයෝපති මධ්‍යස්ථානයේ 0777320898 දුරකථනයෙන් තොරතුරු විමසා බයෝපති ප්‍රතිකාරවලට යොමු වුයෙමි. විකල්ප වෛද්‍ය ක්‍රමයක් වන බයෝපති ප්‍රතිකාර ආරම්භ කර මාස දෙකක් ගතවන විට එතෙක් භාවිතා කළ ඉන්හේලරය නිතර පාවිච්චි කිරීමට අවශ්‍ය නොවන මට්ටමට රෝගියා සුවය ලැබීය. මාස හතරක් පහක් ගතවන විට හදිසි අවස්ථාවකදී එය පාවිච්චි කළ යුතු මට්ටමක් දක්වා සුවය ලැබීය. මේ අවස්ථාව වන විට කෑම ගැනීමේ ප්‍රමාණය සාමාන්‍ය එම වයසේ ළමයකුගේ මට්ටමට වර්ධනය විය. මාස හයක ප්‍රතිකාර අවසානයේ වෙනද අසාත්මික වන ආහාර පාන සියල්ලම එක දිගට ලබාදෙන ලෙස වෛද්‍යවරයා උපදෙස් දුන්නේය. ආහාර පාන කිසිවකට අසාත්මික නොවන මට්ටමක් පෙන්වූ නිසා පාරිසරික සහ කාලගුණික වෙනස්වීම්වලට පෙන්වන අසාත්මිකතාව ද සොයා බැලීමට උපදෙස් දී ඒවාට ද ඔරොත්තු දීමේ හැකියාව තිබූ නිසා ප්‍රතිකාර අනවශ්‍ය බව වෛද්‍ය මතය විය.

අද මා මේ පිළිබඳව හෙළි කරන අවස්ථාව වන විට මගේ පුතා සම්පූර්ණ සුවය ලබා වසරක් ඉක්ම ගොස් ඇත. ඉතා කුඩා අවධියේ පටන් වසර 10 තිස්සේ බටහිර වෛද්‍යවරුන්ගේ ප්‍රතිකාර මගින් රෝගී තත්ත්වය පාලනය කිරීම පිළිබඳව ඔවුන් ගත් වෙහෙස මම ඉතාමත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි. බයෝපති ප්‍රතිකාර මෙම රෝගය සම්බන්ධයෙන් ඉතාමත් ඉහළ කාර්යක්ෂමතාවකින් යුතු බව සමාජයට අවබෝධ කර දීම මා වැනිම දෙමාපියන් රාශියකට වැදගත් පණිවුඩයකි. මගේ පුතා රැගෙන වසර දහයක් තිස්සේ බොහෝ ප්‍රතිකාර කරන ආයතනවලට ගිය අවස්ථාවල මෙම රෝගය නිසා දුක්විඳින ළමා පරපුර ගැන මම බොහෝ තොරතුරු දනිමි. අප දෙමාපියන් ලෙස නිවැරැදි ප්‍රතිකාරය දෙසට අනෙක් දරුවන් යොමු කිරීමෙන් කරන්නේ බෞද්ධයකු වශයෙන් පුණ්‍යකර්මයකි. එමෙන්ම මෙය අපේ ළමා පරපුර මෙම රෝගී තත්ත්වයෙන් මුද්වාලීමෙන් සෞඛ්‍ය සම්පන්න සමාජයක් ඇති කිරීමට උරදීම වශයෙන් රටට ද හෘද සාක්ෂියට එකඟව කරන උදාර මෙහෙවරකි.

තවද මාස හයකටත් වැඩි කාලයක් තිස්සේ බයෝපති ප්‍රතිකාර ලබමින් සිටි බොහෝ දෙනෙක් මට හමු විය. ඉන් බොහෝ දෙනෙක් හෘද රෝග, ඇදුම, ඉරුවාරදය, ග්‍රැස්ට්‍රයිටිස්, අධික රුධිර පීඩනය වැනි දැනට සාර්ථක ප්‍රතිකාර නොමැති රෝගී තත්ත්වයන්ට මුහුණ දුන් අය විය. ඔවුන් ප්‍රතිකාර පිළිබඳව ප්‍රශංසා කොට කතා කරන බව නිරතුරුව අත්දැකීමෙන් ලද්දකි. මගේ අත්දැකීමේ හැටියට බොහෝමයක් රෝගී තත්ත්වයන්ට බයෝපති ප්‍රතිකාර ඉදිරියෙන්ම සිටින බව පැවසීම අතිශයෝක්තියක් නොවේ. මගේ එම ප්‍රකාශය යම්කිසි දිනක සමාජය ප්‍රත්‍යක්ෂ වශයෙන්ම තේරුම් ගන්නා බව සක් සුදක් සේ පැහැදිලිය. මේ පිළිබඳව උනන්දුවන අයෙකුට තොරතුරු ලබාදීමට මාගේ දුරකථනය විවෘතව පවතී.

**0776 95 6177**
**ආර්. ඒ. මංගලිකා**
සිංහාරමුල්ල, කැලණිය.

සුවසෙත 1

# නිදන්ගත ඇදුම රෝගයෙන් ගැලවීමක් නැද්ද?

නිදන්ගත රෝග නිසා ජීවිතය තිත්තවුණු උදවිය අපමණය. ඇතමුන් බේත්හේත් කිරිමද අතැර දමා සිය රෝගය ගැන නොතකා හරින්නට තරම් ජීවිතය ගැන කලකිරී සිටින්නේ ඉන් සම්පූර්ණ සුවයක් ලබා ගැනීම නිෂ්ඵල ක්‍රියාවකැයි සිතන බැවිනි.


නිදන්ගත රෝග අතර "ඇදුම රෝගය" අප අතර බහුලව දකින්නට ලැබෙන රෝගයකි. ඇදුම රෝගයට ගොදුරුවුණු රෝගියාට බෙහෙවින් අසහනකාරී ජීවිතයක් ගෙවන්නට සිදුවීම නිසා නිසා කායිකව මෙන්ම මානසිකවත් පීඩාවට ලක්වෙයි. ළමා වියේ සිට මහලු විය දක්වා ඕනෑම අවධියකදී ඇදුම රෝගයට යමෙක් ගොදුරු විය හැකියි. එමෙන්ම ඇදුම රෝගය පිණිස රෝග ලක්ෂණ පහළවීමද පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් විය හැකිය.

ශ්වසන ක්‍රියාවලිය සිදුවන්නේ ශ්වසන නාලිකාවලිනි. එම ශ්වසන නාලිකා අග ඇති කුඩා ගර්තවලට වාතය පැමිණීමෙන් ඔක්සිජන් වායුව සමග කාබන්ඩයොක්සයිඩ් රුධිරය හා හුවමාරු වෙයි. ඇදුම වැළඳීමට ශ්වාසනාල සංකෝචනයවී තිබීම හේතුවෙන් ප්‍රශ්වාසය කිරීමේදී අපහසුතා ඇති කෙරේ. ප්‍රශ්වාස ක්‍රියාවලියේදී පේශිවලට උදව්වක් නොමැතිකම නිස එම කාරිය නිසියාකාරයෙන් කිරීම අපහසු වෙයි.

නොනවත්වා එක දිගටම කැස්ස තිබීම, පපුවේ හතිය, හුස්ම ගන්නා විට පපුවේ තද ගතිය, අලුයම අවදිවන කෙනකු නම් හිසේ බර ගතිය වැනි රෝග ලක්ෂණ ඇසුරින් හට ගන්නා 'ඇදුම රෝගය' නිට්ටාවට සුව කිරීමට හැකිදැයි බොහොම දෙනෙක් නොදනිති. නමුත් නිසි ප්‍රතිකාර හා ක්‍රමානුකූල කල් පැවැත්ම නිසා මේ රෝගයෙන් සම්පූර්ණ සුවය ලබාගත හැකිය.

කාලයක් මුළුල්ලේ පෙනහලුවලට කිසියම් අප ද්‍රව්‍යයක් ඇතුළු වීම නිසාත් අවේලාවේ දිය නෑම, වැස්සේ පින්නේ තෙමීම, නිදි මැරීම ආදී කරුණු හේතු කොට ගෙන ද යමකුට ඇදුම රෝගය ඇතිවන්නට පුළුවන.

"බයෝපති වෛද්‍ය ක්‍රමය" ඇසුරින් බොහොමයක් නිදන්ගත රෝග නිට්ටාවට සුව කෙරෙනා බව මෑතක සිට කියැවෙනවා. කාලාන්තරයක් මුළුල්ලේ ඇදුම රෝගයෙන් පෙළුණු රෝගියෙකු 'බයෝපති වෛද්‍ය ක්‍රමය ඇසුරින් නිට්ටාවට සුව කළ හැකිද?



බයෝපති වෛද්‍ය ක්‍රමය යැයි කියන්නේ දිනෙන් දින අලුත් වන ලෝකයේ නව සොයා ගැනීමක්. මේ නව වෛද්‍ය ක්‍රමය මෙතෙක් බිහිවුණු වෛද්‍ය ක්‍රමවලට වඩා බෙහෙවින් වෙනස් ක්‍රමයකි. මෙය අපට අලුත් වෛද්‍ය ක්‍රමයක් වුවත් ජපානයේ එයට තිබෙන්නේ දිගු ඉතිහාසයකි.

"බයෝපති වෛද්‍ය ක්‍රමය" මගින් ලබාදෙන ප්‍රතිකාර ද්‍රව්‍ය පිළිබඳ ජපානයේ ගිෆෝ නගරයේ පිහිටි බයෝපති විශ්ව විද්‍යාලයේ දිනපතා පර්යේෂණ සිදු කෙරෙන බවත් ඇමරිකාව, මැලේසියාව, රුසියාව වැනි රටවල මේ ක්‍රමය බෙහෙවින් ව්‍යාප්තව වෙමින් පවතින බවත් සත්‍යයකි.

මෙම ක්‍රමයේදී රෝගියාට ඖෂධ නියත් කරනු ලබන්නේ රෝගියාගේ පැවැත්ම ගැන දිගු කාලීන නිරීක්ෂණයකින් පසුවය. නිසි අයුරින් මෙම ස්වභාවික ඖෂධ ලබා දීමෙන් ඇදුම රෝගය නිට්ටාවට සුව කළ හැකිය. බටහිර ක්‍රමයේ ඖෂධ කිසිවක් මෙහිදී නියම නො කෙරෙන අතර ස්වභාවික ශාඛ සාර ඇසුරින් නිශ්පාදිත බෙහෙත් වර්ගයක් පමණක් මෙහිදී නියම කෙරෙනු ඇත.

බයෝපති වෛද්‍ය ක්‍රමයේදී රෝගියා තියුණු ලෙස පරීක්ෂණයට ලක් කෙරුණද කිසිම විටෙකත් බටහිර වෛද්‍ය ක්‍රමයෙහි එන ආකාරයේ වෛද්‍ය පරීක්ෂණ කිසිවකුට ලක්විය යුතු නොවේ. ක්‍රමාණුකූලව දෙනු ලබන ස්වභාවික ඖෂධ මගින් රෝගය නිට්ටාවට සුව කෙරෙනවා.

ආහාරපාන ගැනීම හා එදිනෙද දිවි පැවැත්ම වෛද්‍ය උපදෙස් අනුව කළ යුතුයි.

බයෝපති වෛද්‍ය ක්‍රමයේ තවත් තොරතුරු ලබන කලාපයේ කියවන්න.

උපදෙස් -
**බයෝපති වෛද්‍ය එච්ල්ටන්**
සටහන -
**සෑම් පෙරේරා**